


සාගර යුක්තිය සහ ප්‍රජා බලය: ධීවර ප්‍රජා පාරිභාෂික ශබ්දකෝෂය



මෙම පොත් පිංච මගින් පහත සඳහන් ක්ෂේත්‍රවල භාවිතා වන වැදගත් වචන පිළිබඳව පැහැදිලි කරනු ලබයි:




- සාගර සංරක්ෂණය (Ocean conservation)
- ධීවර කර්මාන්තය (Fisheries)
- දේශගුණික විපර්යාස (Climate Change)
- ජෛව විවිධත්වය (Biodiversity)
- ප්‍රජා අයිතිවාසිකම් (Community rights)
- වෙරළබඩ පාලනය (Coastal governance)


අනිත් පිටුව බලන්න.

මෙම ශබ්දකෝෂයේ අරමුණ වන්නේ තමන්ගේ මුහුදු, ගොඩබිම, ජීවනෝපාය සහ අනාගතයට බලපාන තීරණ පිළිබඳව නිවැරදිව වටහා ගැනීමට ප්‍රජාවට සහය වීමයි.

දේශගුණික විපර්යාස සහ සාගර යුක්තිය (Climate Change and Ocean Justice):

දේශගුණික විපර්යාස හේතුවෙන් සාගරයට දැඩි බලපෑම් එල්ල වේ; එය වායුගෝලයේ ඇති විශාල තාපය සහ කාබන් ඩයොක්සයිඩ් ප්‍රමාණයක් උරා ගනී. කෙසේ වෙතත්, සාගර ආම්ලිකකරණය (acidification), මුහුදු මට්ටම ඉහළ යාම සහ සාගර දියවැල් වෙනස් වීම වැනි බලපෑම් සැමට එක හා සමානව දැනෙන්නේ නැත. හරිතාගාර වායු විමෝචනයට අවම දෙයකත්වයක් සපයන, සංවර්ධනය වෙමින් පවතින රටවල සහ කුඩා දූපත් රාජ්‍යයන්හි වෙසෙන අවදානමට ලක්විය හැකි වෙරළබඩ ප්‍රජාව මෙයින් අසමාන ලෙස දැඩි පීඩාවට පත් වෙති. මෙයින් පැහැදිලි වන්නේ දේශගුණික විපර්යාසයන්හි බලපෑම බෙදී යාමේදී පැහැදිලි අසාධාරණයක් සිදුවන බවයි. එබැවින් දේශගුණික යුකතිය (Climate Justice) යන්න සාගර යුක්තිය (Ocean Justice) සමඟ අත්‍යවශ්‍යයෙන්ම බැඳී පැවතිය යුතුය.







සාගර යුක්තිය (Ocean Justice):

සාගර සම්පත්වලින් ලැබෙන ප්‍රතිලාභ මෙන්ම සාගර සංරක්ෂණයේදී පැටවෙන බර හෝ සීමාවන් ද සාධාරණව හා සමානව බෙදී යාම මෙයින් අදහස් කෙරේ. මෙය පාරිසරික ආරක්ෂණය, සමාජ සාධාරණත්වය සහ මානව අයිතිවාසිකම් එකිනෙක හමුවන තැන පිහිටා ඇත. එමගින් කොන් කරන ලද වෙරළබඩ ප්‍රජාවන්ට සාගර දූෂණය, අධික ලෙස මසුන් ඇල්ලීම හෝ දේශගුණික විපර්යාස හේතුවෙන් අසාධාරණ ලෙස හානි සිදු නොවන බව සහතික කරයි.

සම්පත් සාධාරණත්වය (Resource Equity):

මසුන් ඇල්ලීම, ඛනිජ සම්පත් මෙන්ම සාගර සම්පත්වලින් ලැබිය හැකි විභව ප්‍රතිලාභ, අවදෙනම් සහ අවස්ථා ප්‍රජාවන් අතර සාධාරණ ලෙස බෙදා හැරීම මෙයින් අදහසේ කෙරේ.

GREENPEACE

ආයතනික වගකීම (Corporate Accountability):

තීරණ ගන්නන් තමන්ගේ ක්‍රියාවන් සාධාරනීකරණය කිරීමට සහ එහි ප්‍රතිවිපාකවලට මුහුණ දීමට බැඳී සිටීමයි. නාවික ප්‍රවාහනය, බලශක්තිය, ධීවර කර්මාන්තය සහ සංචාරක ව්‍යාපාරය වැනි සාගර ආශ්‍රිත කර්මාන්තවලදී බහුජාතික සමාගම් (Multinational corporations) විශාල භූමිකාවක් ඉටු කරන බැවින් ඔවුන් ප්‍රජාවට සහ පරිසරයට වගකීමට බැඳී සිටී.

ගොඩබිම, ජීවනෝපාය සහ ජීවත්වීමේ අයිතිය (Right to Land, Livelihood and Life):

ප්‍රජාවන්ට තමන්ගේ සාම්ප්‍රදායික වෙරළබඩ ප්‍රදේශවල දිගටම ජීවත් වීමට, මසුන් ඇල්ලීමට, රැකියා කිරීමට සහ ආරක්ෂිතව පැවැත්ම තහවුරු කර ගැනීමට ඇති අයිතියයි.



උපදේශනය සහ කැමැත්ත අතර වෙනස (Consultation vs Consent):

තීරණ ගැනීමට පෙර බලධාරීන් හෝ සංවිධාන ඔබගේ අදහස් විමසීම උපදේශනය (Consultation) නම් වේ. සමහර විට, උපදේශනය සිදු වුවද අවසාන තීරණය වෙනස් නොවේ. තවත් සමහර විට, තීරණය දැනටමත් ගෙන ඇති අතර, උපදේශනය යන්න ප්‍රජාවට තොරතුරු බෙදා හැරීම පමණක් වෙයි.

නමුත් සැබෑ කැමැත්ත (True Consent) සඳහා සාම්ප්‍රදායික/දේශීය ක්‍රමවේදයන් හරහා නිල අනුමැතියක් අවශ්‍ය වේ. වඩාත්ම වැදගත් දෙය නම්, කැමැත්ත යනු 'දිගින් දිගටම අලුත් වන බදු දීමක්' වැනිය; යම් සංවර්ධකයෙකු සාගර සීමාවන් උල්ලංඝනය කළහොත් හෝ තෙල් කාන්දුවක් සිදු කළහොත්, ලබා දුන් කැමැත්ත ඉල්ලා අස්කර ගැනීමට (රදවා ගැනීමට) ප්‍රජාවට පූර්ණ අයිතිය ඇත. තමන්ගේ ගොඩබිම, මුහුදු හෝ ජීවනෝපායට බලපාන සංරක්ෂණ ප්‍රතිපත්ති සහ නීති රීති වැනි තීරණ පිළිගැනීමට හෝ ප්‍රතික්ෂේප කිරීමට හැකි වන පරිදි, ප්‍රජාවන්ට මුල් අවදියේම නිසි ලෙස තොරතුරු ලැබීමට සහ උපදේශනයට ලකවීමට අයිතියක් ඇත.







ප්‍රායෝගිකව FPIC බලාත්මක කරනු ලබන්නේ ලිඛිත කැමැත්ත ලබා ගැනීමේ ක්‍රියාවලීන්, ප්‍රජා රැස්වීම්, ලේඛනගත ගිවිසුම් සහ කැමැත්ත ඉල්ලා අස්කර ගැනීමේ අයිතිය මගිනි. මෙය දේශීය සහ ආදිවාසී ප්‍රජාවන්ගේ අයිතිවාසිකම්, සාම්ප්‍රදායික දැනුම සහ ජීවනෝපායන් ආරක්ෂා කිරීම සඳහා යොදු ගැනේ.

නිදහස්, පූර්ව සහ දැනුවත් පදනම මත එකඟතාවය (FPIC)

Free, Prior and Informed Consent

නිදහස්, පූර්ව සහ දැනුවත් පදනම මත එකඟතාවය යන්නෙන් අදහස් කරන්නේ ප්‍රජාවන්ට හුදෙක් තොරතුරු දැනගැනීමට පමණක් නොව, තීරණ ගැනීමට ද අයිතියක් ඇති බවයි. මූලික වශයෙන්, ප්‍රාදේශීය ප්‍රජාවන්ගේ එකඟතාවයකින් තොරව ඔවුන්ගේ ප්‍රදේශයේ කිසිදු ව්‍යාපෘතියක් හෝ තීරණයක් ක්‍රියාත්මක නොවිය යුතුය.

- නිදහස් (Free) කිසිදු බලකිරීමක්, තර්ජනයක් හෝ අනිසි බලපෑමක් නොමැති වීම.
- පූර්ව (Prior) තීරණ ගැනීමට හෝ ව්‍යාපෘති ආරම්භ කිරීමට ප්‍රථමයෙන්ම කැමැත්ත ලබා ගැනීම.
- දැනුවත් (Informed) ප්‍රජාවට තේරුම් ගත හැකි භාෂාවකින්, සම්පූර්ණ සහ සත්‍ය තොරතුරු ලබා දීම.
- කැමැත්ත (Consent) ඔව් හෝ නැත කීමට, නැතහොත් කොන්දේසි පිළිබඳව සාකච්ඡා කිරීමට (Negotiate) ඇති අයිතිය. පිළිබඳව සාකච්ඡා කිරීමට (Negotiate) ඇති අයිතිය.

සහභාගීත්වය (Participation):

ජෛව විවිධත්වය පළිබඳ සම්මුතියේ (CBD) මූලධර්මවලට අනුව, සැබෑ සහභොගීත්වය යනු තීරණ ගත් පසු ප්‍රජාවට දැනුම් දීම නොව, සාගර, ගොඩබිම සහ සංරක්ෂණය, පිළිබඳ තීරණවලට ප්‍රජාව සැබෑ ලෙසම දායක කර ගැනීමයි. එහි තේරුම: ප්‍රජාවට අදහස් දැක්වීමට සහ ඒවාට සවන් දීමට ඉඩ දීම, ඔවුන්ගේ අදහස් මත තීරණ වෙනස් විය හැකි වීම සහ සැලසුම්කරණයේ ආරම්භයේ සිටම ඔවුන් එහි කොටස්කරුවන් වීමයි.

සැබෑ සහභාගීත්වය (Real participation) = ඔබගේ හඬට වටිනාකමක් ඇත, තීරණ වෙනස් කළ හැක

ව්‍යාජ සහභාගීත්වය (Fake participation) = තීරණය ගෙන අවසානය, ඔබට දැනුම් දීමක් පමණක් සිදු කරයි.

පාලනය, පරිසරය සහ සම්පත් කළමනාකරණය (Governance & Ecosystem)



තිරසාර ධීවර කර්මාන්තය (Sustainable Fishing):
අනාගත මත්ස්‍ය තොග හෝ සාගර පරිසර පද්ධති විනාශ නොවන පරිදි මසුන් ඇල්ලීමයි. මෙයට පැටවුන් (ළාබාල මසුන්) ඇල්ලීමෙන් වැළකීම, විනාශකාරී ආම්පන්න භාවිත නොකිරීම සහ මසුන් බෝවන ප්‍රදේශ ආරක්ෂා කිරීම ඇතුළත් වේ.

සංරක්ෂණය (Conservation):
ස්වභාවධර්මය අනාගත පරපුර උදෙසා පවතින පරිදි ප්‍රවේශමෙන් භාවිත කරමින් එය ආරක්ෂා කිරීමයි. මෙයට මත්ස්‍ය වාසස්ථාන ආරක්ෂා කිරීම, කඩොලාන සහ කොරල්පර ප්‍රතිස්ථාපනය කිරීම, දූෂණය අවම කිරීම සහ සම්පත් වගකීමෙන් යුතුව කළමනාකරණය කිරීම ඇතුළත් වේ.

සහ-කළමනාකරණය (Co-management):
ස්වභාවික සම්පත් කළමනාකරණය කිරීමේ වගකීම රජය සහ ප්‍රාදේශීය ප්‍රජාවන් අතර ඒකාබද්ධව බෙදා ගැනීමයි.

ප්‍රජා මූලික සංරක්ෂණය (Community-led Conservation):
ප්‍රාදේශීය ප්‍රජාවන් විසින්ම සැලසුම් කර, ක්‍රියාත්මක කර, පාලනය කරනු ලබන සංරක්ෂණ වැඩසටහන් වේ.

සාම්ප්‍රදායික / දේශීය දැනුම (Traditional/ Local Knowledge):
පරිසරය, පාරිසරික පද්ධති සහ සම්පත් භාවිතය පිළිබඳව ප්‍රජාවන් විසින් පරම්පරා ගණනාවක් තිස්සේ වර්ධනය කරගත් දැනුම් පද්ධතීන්ය.

පාලනය (Governance):
සම්පත් මත තීරණ ගැනීම සහ අධිකාරී බලය ක්‍රියාත්මක කරන පද්ධතීන් සහ ක්‍රියාවලීන් වේ.

නිරීක්ෂණය / පසු විපරම (Monitoring):
පාරිසරික හෝ සමාජීය තත්ත්වයන් කාලයත් සමඟ ක්‍රමවත්ව ලුහුබැඳීමයි. එමගින් අනාගත අභියෝග පුරෝකථනය කිරීමට සහ ව්‍යාපෘති සාර්ථකව ක්‍රියාත්මක වේදැයි බැලීමට හැකියාව ලැබෙයි.

නීය බලාත්මක කිරීම (Enforcement):
නීති සහ රීතිවලට අනුකූල වීම සහතික කිරීම සඳහා ඒවා ක්‍රියාවට නැංවීමයි.

පාර්ශවකරුවන් සහ අයිතිවාසිකම් හිමිකරුවන් (Stakeholders vs Rights Holders):

- **පාර්ශවකරුවන් (Stakeholders):**
  - යම් තීරණයකින් බලපෑමට ලක්වන හෝ ඒ පිළිබඳ උනන්දුවක් දක්වන පුද්ගලයන්/කණ්ඩායම් වේ.

- **අයිතිවාසිකම් හිමිකරුවන් (Rights Holders):** නීත්‍යානුකූල හෝ



වෙරළ ඛාදනය (Coastal Erosion)


රළ, වඩදිය බාදිය, දියවැල් සහ කුණාටු මගින් වෙරළ තීරය අඛණ්ඩව සේදී යාම නිසා සිදුවන ගොඩබිම ක්‍රමානුකූලව අහිමි වීමයි. කාලයත් සමඟ මුහුදු ගොඩබිම දෙසට පැමිණෙන අතර, පෙර වියළිව පැවති බිම සාගරයේ කොටසක් බවට පත්වේ.

- **ස්වභාවික හේතු:** ප්‍රබල රළ සහ කුණාටු, දේශගුණික විපර්යාස නිසා මුහුදු මට්ටම ඉහළ යාම සහ දියවැල්වල නිරන්තර චලනය.
- **මානව හේතු:** වෙරළෙන් සහ ගංගාවලින් වැලි කැණීම, කඩොලාන සහ මුහුදු තෘණ වැනි ආරක්ෂිත පරිසර පද්ධති විනාශ කිරීම, හෝටල්, මාර්ග සහ වරාය වැනි අවිධිමත් වෙරළබඩ ඉදිකිරීම් සහ වෙරළ දිගේ වැලි ස්වභාවිකව ගමන් කිරීම අවහිර කිරීම.
- **භූමියේදී දැකිය හැකි ලක්ෂණ:** වෙරළ තීරය පටු වීම, වෙරළට ආසන්න බිම් ඉරිතැලීම හෝ කඩා වැටීම, පොල් ගස් මුහුදට ඇද වැටීම, වෙරළ ආසන්නයේ ජලය ගැඹුරු වීම සහ නිවාස, මාර්ග හා වගා බිම් මුහුදට බිලිවීම.
- **මෙය වැදගත් වන්නේ ඇයි?:** වෙරළ ඛාදනය වෙරළබඩ පවුල්වල ආරක්ෂාවට සහ නිවාසවලට සෘජුවම තර්ජනයක් වේ, ධීවර තොටුපළවල් අහිමි කරයි, ළිං ජලයට කරදිය මිශ්‍ර කරයි, සංචාරක ව්‍යාපාරයට හානි කරයි, සහ වෙරළබඩ පරිසර පද්ධති දුර්වල කරයි.



ශ්‍රී ලංකාවේ නීතිමය සහ ආරක්ෂිත ප්‍රදේශ වර්ගීකරණය (Protected Area Categories in Sri Lanka)





ආරක්ෂිත ප්‍රදේශ (Protected Areas):
වනජීවී සහ පරිසර පද්ධති ආරක්ෂා කිරීම සඳහා විශේෂ නීති රීති යටතේ කළමනාකරණය කරනු ලබන ගොඩබිම් හෝ මුහුදු කලාප වේ. මේවායේ මසුන් ඇල්ලීම සීමා කිරීම, සංවර්ධන කටයුතු පාලනය කිරීම සිදු කෙරේ.

මුහුදු ආරක්ෂිත ප්‍රදේශ සහ යුක්තිය (Marine Protected Areas):
සාගර ජෛව විවිධත්වය සහ පරිසර පද්ධති සංරක්ෂණය කිරීම සඳහා නීත්‍යානුකූලව කළමනාකරණය කරනු ලබන මුහුදු ප්‍රදේශයකි. නමුත් මෙහිදී "යුක්තිය" යන්නෙන් අදහස් කරන්නේ: ප්‍රජාවන් අසාධාරණ ලෙස ඉවත් නොකිරීම, ධීවරයන් සමඟ සාකච්ඡා කිරීම, ඔවුන්ගේ ජීවනෝපායන් ආරක්ෂා කිරීම සහ ප්‍රතිලාභ සාධාරණව බෙදා ගැනීමයි.

රැම්සා තෙත්බිම් (Ramsar Wetlands):
රැම්සා සම්මුතියට අනුව, ගංගාවල සිට කොරල්පර දක්වා පුළුල් පරාසයක පවතින ස්වභාවික හෝ මිනිසා විසින් නිර්මාණය කරන ලද වාසස්ථාන තෙත්බිම් ලෙස වර්ගීකරණය කළ හැකිය. මඩ වගුරු, විල්, කලපු, ලුණු වගුරු, කඩොලාන, කොරල්පර, හෝ ස්වභාවික හෝ කෘතිම, ස්ථිර හෝ තාවකාලික ජල කඳන් මෙයට ඇතුළත් වේ. බාදිය පවතින අවස්ථාවලදී මීටර් හයකට (6m) වඩා ගැඹුරු නොවන වෙරළබඩ මුහුදු ජලය ද මෙයට ඇතුළත් වේ. භූගත තෙත්බිම් ද මෙහි පැවතිය හැක.

දැඩි ස්වභාවික රක්ෂිත (Strict Nature Reserves - SNR):
වනසත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥාපනත යටතේ ලංකාවේ දැඩි ස්වභාවික රක්ෂිත 3ක් ප්‍රකාශයට පත් කර ඇත (හක්ගල, යාල සහ රිටිගල). පාරිසරික අගයන් ආරක්ෂා කිරීම සඳහා මෙම ප්‍රදේශවලට මිනිසුන් ඇතුළු වීම, භාවිතය සහ බලපෑම් දැඩි ලෙස පාලනය කර ඇත. මේවා පර්යේෂණ සඳහා යොදා ගන්නා අතර ආවේණික ජීවීන්ට (Point endemic) සුවිශේෂී වාසස්ථාන සපයයි. සාමාන්‍ය ජනයාට ඇතුළුවීම තහනම් වුවද, නිල රාජකාරියක නිරත වීමට හෝ අනුමත විද්‍යාත්මක පර්යේෂණ සඳහා

විශේෂ කළමනාකරණ ප්‍රදේශ (Special Management Areas - SMA):
සංවේදී හෝ වැදගත් බැවින් අතිරේක සැලකිල්ලක් සහ විශේෂ නීති අවශ්‍ය වන ප්‍රදේශ වේ. මේවා සම්පූර්ණයෙන්ම වසා දැමූ ප්‍රදේශ නොවන අතර, මසුන් ඇල්ලීම පාලනය කිරීම සහ සංවර්ධන කටයුතු සීමා කිරීම සිදු කෙරේ.

ජාතික උද්‍යාන (National Parks):
ශ්‍රී ලංකාව පුරා ජාතික උද්‍යාන 25කට වඩා පිහිටුවා ඇත්තේ නරඹන්නන්ට විද්‍යාත්මක, අධ්‍යාපනික, විනෝදාත්මක සහ සෞන්දර්යාත්මක අවස්ථා ලබා දීමටයි. වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ නියමිත නිලධාරියෙකු විසින් නියමිත ගාස්තු ගෙවීමෙන් පසු නිකුත් කරනු ලබන බලපත්‍ර සහිතව කොන්දේසිවලට යටත්ව අමුත්තන්ට ජාතික උද්‍යානයට ඇතුළු වීමට අවසර ඇත.

සාගරික ජාතික උද්‍යාන (Marine National Parks):
නීතිමය ප්‍රතිපාදන සාමාන්‍ය ජාතික උද්‍යානයකට සමාන වේ. නරඹන්නන්ට සතුන් සහ ශාක නිරීක්ෂණය සහ අධ්‍යයනය සඳහා ඇතුළු වීමට අවසර ඇත. කෙසේ වෙතත්, සාගරික ජාතික උද්‍යානය පිහිටුවීමට පෙර පැවති කිසියම් සාම්ප්‍රදායික භාවිතයක් හෝ චාරිත්‍රයක් කොන්දේසි පැනවීම මගින් අඛණ්ඩව පවත්වාගෙන යාමට ඉඩ දෙනු ලැබේ. ශ්‍රී ලංකාවේ පළමු සාගරික ජාතික උද්‍යානය ලෙස ආදම්ගේ පාලම (Adam’s Bridge) ප්‍රකාශයට පත් කර ඇත.

සාගර රක්ෂිත (Marine Reserves):
වනසත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥාපනතේ ප්‍රතිපාදන යටතේ මෙතෙක් ප්‍රකාශයට පත් කර නොමැති සාගර ආරක්ෂිත ප්‍රදේශ විශේෂයකි.





බෆර් කලාපය / ස්වාරක්ෂක කලාපය (Buffer zone):
ජාතික උද්‍යානයක බාහිර සීමාවේ සිට විහිදෙන, රජයට අයත් ඉඩම්වලින් සමන්විත විය යුතු කලාපයකි. එය ජාතික උද්‍යානයට වඩා හොඳ ආරක්ෂාවක් සපයන අතර මානව බලපෑම අවම කරයි. ශ්‍රී ලංකාවේ මෙතෙක් නිල බෆර් කලාප ප්‍රකාශයට පත් කර නැතත්, වනසත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥාපනතේ 9A වගන්තිය අනුව ජාතික උද්‍යානයට වන මානව බලපෑම් සීමා කර ඇත.

ධීවර කළමනාකරණ ප්‍රදේශ (Fisheries Management Areas - FMA):
මත්ස්‍ය ගහනය අධික ලෙස පරිභෝජනය නොකිරීම සහ සාගර පරිසර පද්ධති නිරෝගීව පැවතීම සහතික කිරීම සඳහා විශේෂ නීති රීති සහිතව මසුන් ඇල්ලීමේ කටයුතු කළමනාකරණය කරන මුහුදු හෝ වෙරළබඩ ජල කොටස් වේ.



මෙහිදී බලධාරීන් විසින් පහත සඳහන් නීති හඳුන්වා දිය හැකිය:

- ඇල්ලිය හැකි මසුන් ප්‍රමාණය සීමා කිරීම (Catch limits),
- ධීවර වාර/කාල සීමාවන් නියම කිරීම (විවෘත සහ වසා ඇති කාල සීමාවන්),
- හානිකර ධීවර ආම්පන්න තහනම් කිරීම (විනාශකාරී දැල් හෝ ක්‍රම),
- මසුන් බෝවන සහ කුඩා මසුන් වැඩෙන ප්‍රදේශ ආරක්ෂා කිරීම,
- නීති විරෝධී හෝ වාර්තා නොවන ධීවර කටයුතු නිරීක්ෂණය කිරීම.
- මෙහි අරමුණ මසුන් ඇල්ලීම නැවැත්වීම නොව, අනාගතය සඳහා ධීවර කර්මාන්තය තිරසාර (Sustainable) කිරීමයි.



අනෙකුත් ඵලදායී ප්‍රදේශ පාදක සංරක්ෂණ පියවර (Other Effective Area-Based Conservation Measures):
නිල ආරක්ෂිත ප්‍රදේශවලින් පරිබාහිරව, නමුත් ඒව විවිධත්වය සාර්ථකව සංරක්ෂණය කෙරෙන වෙනත් ඵලදායී ප්‍රදේශ වේ.

ජාත්‍යන්තර සම්මුතීන් සහ රාමු (International Conventions & Frameworks)

ජෛව විවිධත්වය පිළිබඳ සම්මුතිය (CBD - The Convention of Biological Diversity):
ජෛව විවිධත්වය ආරක්ෂා කිරීම සඳහා රටවල් අතර ඇති කරගත් ගෝලීය ගිවිසුමකි. එය 1992 රියෝ ද ජැනයිරෝ හි පැවැත්වුණු මිහිතල සමුළුවේදී නිර්මාණය විය. ශ්‍රී ලංකාව ද මෙහි සාමාජිකයෙකි. එහි ප්‍රධාන අරමුණු 3කි: ජෛව විවිධත්වය ආරක්ෂා කිරීම, සොබාදහම තිරසාර ලෙස භාවිත කිරීම සහ සම්පත්වලින් ලැබෙන ප්‍රතිලාභ සාධාරණ ලෙස බෙදා හැරීම (උදා: සමාගම් දේශීය දැනුම භාවිත කරන්නේ නම් ප්‍රජාවන්ට ද එහි ප්‍රතිලාභ ලැබිය යුතුය).

ජාතික ජෛව විවිධත්ව උපාය මාර්ග සහ ක්‍රියාකාරී සැලැස්ම (NBSAP):
CBD සම්මුතිය යටතේ රටක් විසින් සකස් කරනු ලබන ජාතික සැලැස්මයි. මෙයට කඩොලාන ප්‍රතිස්ථාපනය, මුහුදු සංරක්ෂණය සහ ප්‍රජා සහභාගීත්වය ඇතුළත් වේ. මෙම වාර්තාව රජයේ ප්‍රතිපත්ති, අරමුදල් සහ ධීවර අයිතිවාසිකම්වලට සෘජුවම බලපායි.

ජාතික වශයෙන් නිර්ණය කරන ලද දායකත්වයන් (NDC - National Determined Contributions):
පැරිස් ගිවිසුම යටතේ දේශගුණික දූෂණය අවම කිරීමට සහ මිනිසුන් ආරක්ෂා කිරීමට රටවල් ලබා දෙන දේශගුණික ක්‍රියාකාරී පොරොන්දු වේ. මෙය වෙරළබඩ ප්‍රජාවන්ට බලපාන බැවින් ප්‍රජා සහභාගීත්වය අත්‍යවශ්‍ය වේ.

කුන්මින්-මොන්ට්‍රියල් ගෝලීය ජෛව විවිධත්ව රාමුව (KMBGF):
2022 දී සම්මත කරගත්, 2030 වන විට ජෛව විවිධත්වය ආරක්ෂා කිරීම සඳහා වන ගෝලීය සැලැස්මයි. මෙයට ගෝලීය ඉලක්ක 23ක් ඇතුළත් වේ.





30 යි 30 ඉලක්ක (30 by 30 Targets):
2030 වන විට ලෝකයේ ගොඩබිමෙන් 30%ක් සහ සාගරයෙන් 30%ක් ආරක්ෂිත ප්‍රදේශ බවට පත්කිරීමේ ගෝලීය ඉලක්කයයි.

කලාපීය ධීවර කළමනාකරණ සංවිධානය (Regional Fisheries Management Organization):
දේශසීමා හරහා ගමන් කරන මත්ස්‍ය තොග කළමනාකරණය කිරීමට රටවල් එකතුවී ක්‍රියා කරන කලාපීය ධීවර කළමනාකරණ සංවිධානයයි.

දේශීයව කළමනාකරණය කරන ලද සාගර ප්‍රදේශය (LMMA):
ප්‍රාදේශීය ප්‍රජාවන් විසින්ම ප්‍රධාන වශයෙන් කළමනාකරණය කරනු ලබන මුහුදු ප්‍රදේශ වේ.

ජාතික පාරිසරික ක්‍රියාකාරී සැලැස්ම (National Environmental Action Plan):
රජයේ පාරිසරික ප්‍රමුඛතා සහ ක්‍රියාමාර්ග පෙන්වා දෙන ජාතික පාරිසරික ක්‍රියාකාරී සැලැස්මයි.



පාරිසරික තක්සේරු සහ මූලධර්ම (Environmental Assessments & Principles)

පාරිසරික බලපෑම් තක්සේරුව (EIA - Environmental Impact Assessment):
විශාල ව්‍යාපෘතියක් ආරම්භ කිරීමට පෙර, එයින් පරිසරයට, ධීවර කර්මාන්තයට හෝ ප්‍රජා ජීවනෝපායන්ට හානියක් සිදුවේදැයි සොයා බැලීමට සිදු කරන සවිස්තරාත්මක අධ්‍යයනයකි.

පාරිසරික හා සමාජීය බලපෑම් තක්සේරුව (ESIA):
EIA එකකට සමාන වන නමුත්, ව්‍යාපෘතියක් මගින් මිනිසුන්ගේ සමාජීය, ආර්ථික, සංස්කෘතික
තත්වයන්ට සහ ජීවනෝපායන්ට සිදුවන බලපෑම් (Relocation risks, women, vulnerable
groups) පිළිබඳවද මෙහිදී විශේෂයෙන් අධ්‍යයනය කෙරේ.

උපාය මාර්ගික පාරිසරික තක්සේරුව (SEA - Strategic Environment Assessment):
ජාතික මට්ටමේ සැලසුම්, ප්‍රතිපත්ති හෝ මහා පරිමාණ සංවර්ධන උපාය මාර්ගවල පාරිසරික බලපෑම් ඇගයීමයි.

මූලික පාරිසරික පරීක්ෂණය (IEE - Initial Environmental Examination):
පූර්ණ පාරිසරික බලපෑම් තක්සේරුවක් (EIA) අවශ්‍යද නැද්ද යන්න තීරණය කිරීමට ව්‍යාපෘතියකට පෙර සිදු කරන මූලික අධ්‍යයනයකි.





පරිසර සංහාරය Ecocide):
පරිසර පද්ධති බිඳ වැටෙන, ජීවී විශේෂ වඳ වී යන සහ ප්‍රජාවන්ට ජීවනෝපාය අහිමි වන පරිදි සිදු කරන මහා පරිමාණ, දරුණු පාරිසරික විනාශයන් ය. (උදෘ: විශාල තෙල් කාන්දු, කඩොලාන හෝ කොරල්පර මහා පරිමාණයෙන් විනාශ කිරීම). ක්‍රියාකාරීන් උත්සහ කරන්නේ මෙය ජාත්‍යන්තර අපරාධයක් (International Crime) ලෙස පිළිගැනීමට සැලැස්වීමටයි.

දූෂකයා විසින් ගෙවීමේ මූලධර්මය (PPP - Polluters Pay Principle):
පරිසර දූෂණය සිදු කරන පුද්ගලයා හෝ සමාගම විසින් පිරිසිදු කිරීම්, ප්‍රතිස්ථාපනය කිරීම් සහ සිදු වූ පාරිසරික හානිය සඳහා වන්දි ගෙවිය යුතුය යන මූලධර්මයයි.

නිල් කාබන් (Blue Carbon):
කඩොලාන, මුහුදු තෘණ සහ ලුණු වගුරු වැනි වෙරළබඩ පරිසර පද්ධති මගින් වායුගෝලයෙන් උරාගෙන ගබඩා කරනු ලබන කාබන් ය. මේවා දේශගුණික විපර්යාසවලට එරෙහිව සටන් කිරීමට බෙහෙවින් උපකාරී වේ.

මානව අයිතිවාසිකම් පාදක කරගත් ප්‍රවේශයන් (HRBAs - Human Rights-Based Approaches):
පාරිසරික සහ සංරක්ෂණ තීරණ ගැනීමේදී මානව අයිතිවාසිකම්වලට ගරු කිරීම සහතික කරන ප්‍රවේශයකි. සංරක්ෂණය මගින් ප්‍රජාවන් ඉවත් කිරීම, අයිතිවාසිකම් උල්ලංඝනය කිරීම හෝ ප්‍රජා හඬ යටපත් කිරීම සිදු නොකළ යුතුය.















මෙම පොත් පිංච
ග්‍රීන්පීස් දකුණු ආසියාව විසින් ප්‍රජා කේන්ද්‍රීය සාකච්ඡා සහ වෙරළබඩ ප්‍රජාවන්ගේ හඬ ශක්තිමත් කිරීම සඳහා සකස් කරන ලදී.
වෙරළ, සාගරය, ජීවනෝපාය සහ ප්‍රජා අයිතිවාසිකම් පිළිබඳ සාධාරණ, දැනුවත් සහ සහභාගීත්වමය සංවාද සඳහා මෙම ද්‍රව්‍ය භාවිතා කිරීමට අපි ඔබට ආරාධනා කරමු.